# අනේ පොඩි හාමුදුරුවනේ දේශපාලනයෙන් තොරව බුදු දහම පතුරවන්න

ආයුර්වේද වෛද්‍ය හා ජෝතිෂ්‍ය විශාරද
**ස්ටැන්ලි ධර්ම කුමාර**
සිද්ධාර්ථ ජෝතිෂ්‍ය අසපුව

පසුගිය වසර 100ක පමණ කාලය තුල ශ්‍රී ලංකාවේ කලින් කලට විවිධ ආර්ථික, සමාජීය, හා ආගමි ගැටලු උග්‍රවීම නිසා අප රට එවැනි දරුණු අවස්ථාවලදී බුදු දහම හා ජාතිය බේරාගැනීම නිතරම පොඩි ස්වාමින් වහන්සේලා හා අග්‍රපන්ඩිත බුද්ධ පුත්‍රයන් ඉදිරිපත් වූ අවස්ථා එමට ය.

එයට ප්‍රථමව අපට දැකිය හැකි විශේෂිත නිදර්ශන අනුව හික්කඩුවේ ශ්‍රී සුමංගල මහනාහිමි ගත හ ැකි ය. එසේම කලින් කලට ශ්‍රී ලංකාවට නිදහස ලැබූ දා සිට 1948 පසු විවිධ රාජ්‍ය පාලන කාලය තුළ දී ඇති වූ දේශපාලනමය ගැටලු සඳහා 1956 දී ශ්‍රීමත් බණ්ඩාරනායක මහතාගේ කාලයේ කැළණි මහා පුරාන විහාරයේ ප්‍රධාන ස්වාමීන් වහන්සේලා ප්‍රමුඛ භික්ෂු බලවේගයෙන් සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීමේ බලය ලබා දෙමින් භික්ෂූන් විසින් මෙහෙය වූ රජය ජයගත් පසු එය උපන්ගෙයම වලදැමීම පිණිස සෝමාරාම, බුද්ධරක්ඛිත යන ස්වාමීන් වහන්සේලාව බිල්ලට දී වෙනත්, නාදුනන පුද්ගලයෙකු විසින් බණ්ඩාරනායක මහතා ඝාතනය කර මුලු බුදු සසුනම අපහාසයට හා කලකිරීමට පත් කළ විදේශ බලවේග අපට අමතක නැත. ඉන්පසුව 1970 - 1977 කාලයේ දී ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතාගේ කාලයේ දේහපාලනයට පිණිස හෙට්ටිමුල්ලේ වජිරබුද්ධි, දැවමොට්ටාවේ අමරවංශ වැනි ඉතා දක්ෂ කථිකත්වය හිමි පූජ්‍ය පක්ෂය ප්‍රයෝජනයට ගෙන පිහිටුවාගත් රජය විසින් ම එම පූජ්‍ය ජ්ෂයේ තුන්මුල්ල හන්දියේ පිහිටි කුඩා පන්සල ද රජයට ගෙන අතරමං කළ හ. අවසානයේ දී මහා පංඩිත හාමුදුරුවන් දෙදෙනාගේ ආදාහනය ද කිරීමට ස්ථානයක් හා දානය පවා නොමැතිව පෞද්ගලික නිවසක, තනි කාමරයක දුක්බරව අපවත් වී වදාල සේක.

පසුව 1971 දී ඔබට මතක ඇති අතර කොටිකාවත්තේ සද්ධාතිස්ස ස්වාමීන් වහන්සේ දේශපාලනය කිරීම හේතුවෙන් ජනතා විමුක්ති පෙරමුණේ නායකයන් විසින් පූජනීය ස්ථානය තුළ දීම අලුයම පිස්තෝලයක් මුඛයට තබා ඝාතනය කළ හ. තවද මීට අමතරව මෙම භීෂණ කාලය තුළ විවිධ ප්‍රදේශවලදී පාසැල් ගුරු වෘත්තියේ යෙදී සිටි ස්වාමීන් වහන්සේලා ද විවිධ දේශපාලඥයන් විසින් තර්ජන, ගර්ජන හා පන්සල් ද කඩා බිඳ දැමූ හා ගිනිබත් කළ අවස්ථා ද ඇත.

මීට අමතරව 1980 පසු ශ්‍රී ලංකාවේ දේශපාලනයට ඉතා ළඟින් ම උදව් උපකාර හා උපදෙස් දුන් කතරගම වැඩිහිටි කන්දේ ශ්‍රී සිද්ධාර්ථ මහනාහිමි ද කලින් කලට ජනබලය ලබා දීමට උදව් කළ මුත් පසුව තුවක්කුවක් ළඟ තබා ගත් බවට චෝදනා කර එවකට බලයේ සිටි රජය විසින් වසර එකහමාරක සිරදඬුවමක් ද ලබා දෙන ලදි. අරන්තලාවේ දී භික්ෂූන් වහන්සේලා 60 නමක් දමිල ත්‍රස්තවාදීන් විසින් ඝාතනය කරන ලදි.

ඊට අමතරව ගංගොඩවිල සෝම හාමුදුරුවන් ද දේශපාලනයට පිවිසෙන බවට ඇති වූ සැකය හේතුවෙන් ඉතා තීක්ෂණ ලෙස කුමන්ත්‍රණ කර රුසියාවේ දී ඝාතනය කළ බවට නොරහසකි.  දිඹුලාගල මහනායක හාමුදුරුවන් ද දේශපාලන හේතු මත අමානුෂික ලෙස ඝාතනය විය. පසු කලක විවිධ පූජනීය ස්ථානවලම නායක ස්වාමීන් වහන්සේලා ගෝලයන් ලෙස මහණ කර පූජනීය ස්ථානවල අයිතිය භුක්තිය ඉල්ලා විවිධ ප්‍රදේශවල අධිකරණ තුළ දේපල නඩු 950ක් පමණ පංසල් බෙදා ගැනීම පිණිස විවිධ ජාත්‍යන්තර බලවේග මගින් මුදල් යොදා කටයුතු කර ඇත. එය කෝට්ටේ මහා විහාරයට ද අනෙකුත් ප්‍රසිද්ධ පාරම්පරික පූජනීය ස්ථානවලට දැන් ඇතුල් වී ඇත. මීට අමතරව විවිධ බලවේගවලින්  බල මණ්ඩල, දායක සභා හා භාරකාර මණ්ඩල මගින්, පූජනීය ස්ථාන කරනු ලැබෙන මුදල් පරිත්‍යාග එම ස්ථානයට දියුණුවට නොයොදා රජයට ගැනීමේ දේශපාලන වෑයමක් ද දැනට ක්‍රියාත්මක වේ. මෑතකක දී විවිධ හේතූන් මත ප්‍රසිද්ධ තරුණ භික්ෂූන් වහන්සේලා ද සිරගත කරන ලදි. එම කරුණු මෙසේ තිබියදී ඉදිරි වසර 10 තුළ ඉතා උගත් දක්ෂ කථිකත්වය හා ක්‍රියාශීලී පූජ්‍ය පක්ෂය විවිධ දේශපාලකයන් විසින් විවිධ උපක්‍රම මගින් යොදවාගෙන රටට වෛරය පතුරවන, පොදුජනයා බුදු දහම තුළින් ඈත් කර වීමට හා අපහාසයට පත් කිරීම පිණිස අනෙකුත් ජාතීන් හා ආගම් විසින් විවිධ උපක්‍රම යොදයි.

එම නිසා පෙර ඉතිහාසය තුළින් දේශපාලනය කළ ස්වාමීන් වහන්සේලාට විවිධ රාජ්‍ය පාලකයන් විසින් කළ දූෂිත, නීතිවිරෝධී ක්‍රියා ගැන තේරුම් ගෙන බුදුහාමුදුරුවන්ගේ නාමයෙන් සියලුම දේශපාලන කටයුතුවලින් ඈත් වී ශ්‍රී ලංකාවේ ඉතා දුක සේ ජීවිකාව ගෙවන අපගේ ජනතාවට බුදු දහමේ ඇති වෛරයෙන් තොර පංචශීලය රැකීමට පුරුදු පුහුණු කළ යුතු කාලය පැමිණ ඇත. ක්‍රිස්තියානි, මුස්ලිම්, හින්දු, බර්ගර් ආගම්වල කිසිම පූජකවරයෙකු ශ්‍රී ලංකාවේ කිසිම දේශපාලන පක්ෂයකට ගැති නොවී ඇත. ප්‍රසිද්ධියේ වෛරය පතුරුවන්නේ නැත. එම නිසා බුද්ධිමත්ව සිතා බුදු දහම රැකගන්නා ලෙස ඉල්ලමි.




